# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.18 පැය 1555 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 771 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. අකුණු සන්නායකයක තිබූ තඹ පටියක් සොරකම් කිරීමක් සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් වසම**

2025.04.16 වන දින මොරටුව පොලිස් වසමේ ලුනාව ප්‍රදේශයේ අකුණු සන්නායකයක සවිකර තිබූ තඹ පටියක් සොරකම් කිරීමේ සිදුවීමක් සම්බන්ධව මොරටුව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත 2025.04.17 වන දින මොරටුව පොලිස් ස්ථානයේ අපරාධ නිවාරණ රාජකාරී යෙදී සිටි පොලිස් නිලධාරීන් කණ්ඩායමක් සොරකමට සම්බන්ධ සැකකරු හා එම සොරකම් කරන ලද තඹ පටිය සන්තකයේ තබා ගෙන සිටි සැකකරු එම තඹ පටියද සමඟ ලුනාව ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන මොරටුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 29 වයස් වල පසුවන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මොරටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. තෙමහල් ගොඩනැගිල්ලක් ගිනි ගැනීම සම්බන්ධව - අළුත්ගම පොලිස් වසම.**

2025.04.18 වන අද දින උදෑසන කාලයේ අළුත්ගම ප්‍රදේශයේ නිවසක් සහ වෙළඳසැලක් සහිත තෙමහල් ගොඩනැගිල්ලක් ගිනි ගැනීමකට ලක්ව ඇති බවට අළුත්ගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත අළුත්ගම පොලිස් ස්ථානයේ නිලධාරීන් එම ස්ථානය වෙත ගොස් ගිනි නිවීමේ ඒකකයේ නිලධාරීන් සමඟ එක්ව ගින්න මැඩපැවැත්වීමට කටයුතු කර ඇත.

මෙම ගිනිගැනීමට ලක් වූ ගොඩනැගිල්ලේ ස්වණර්ාභරණ සහ ලී කැටයම් භාණ්ඩ වෙළඳසැලක් පවත්වාගෙන යනු ලබන අතර ගින්න ඇති වූ අවස්ථාවේ සේවකයෙකු පමණක් වෙළඳසැලේ සිට ඇත.

ගිනි ගැනීම හේතුවෙන් ජීවිත හානි කිසිවක් සිදු වී නොමැත. රජයේ රස පරීක්ෂක, විදුලි බල මණ්ඩලයේ නිලධාරීන් හා අපරාධ ස්ථාන පරීක්ෂක නිලධාරීන් කැඳවා අළුත්ගම පොලිස් ස්ථානය මඟින් වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

මෙයට අදාල ඡායාරූප කිහිපයක් හා වීඩියෝ පටයක් යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**